විදෙස් ගමන් බලපත් දෙකක් සමඟින්, ශ්‍රී ලංකාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් පසුගියදා චීන ජාතිකයෙකු අත්අඩංගුවට ගැනීම මාධ්‍ය වාර්තා කර තිබිණි. ඔහු චීන රජය විසින් වරෙන්තු නිකුත් කර ඇති අයෙකු බව නීතිපති අභියාචනාධිකරණයට දැනුම් දීම ද, මැයි 30, 2023 දින මාධ්‍ය තුළ වාර්තා වී තිබිණි. එම පුවත වාර්තා කරන සිංහල භාෂා පුවත්පත් කිහිපයක සිරස්තල, එම චීන ජාතික පුද්ගලයාව හඳුන්වා තිබූ අයුරු මෙසේ දැක්විය හැක.

* අරුණ, දිවයින, ලංකාදීප - "චීනා"
* අද, දිනමිණ - "චීන ජාතිකයා"

1) සෘණාත්මක පසුතලයක් තුළ යෙදී තිබෙන මෙම "චීනා" යන යෙදුමෙන්, පොදුවේ චීන ජාතිකයන් කෙරෙහි අවමානාත්මක සහ, ජාතිකත්වය පදනම් කරගත් කොන් කිරීමේ ආකල්පයක් ඇති නොකරන්නේ ද? අද සහ දිනමිණ සිරස්තලයන් තුළ සඳහන් වන ආකාරයට, "චීන ජාතිකයා" යන්න වඩාත් සුදුසු යෙදුමක් නොවන්නේ ද?

2) එය චීන ජාතිකයින් කෙරෙහි විදේශ භීතිකාවක් (xenophobia) ඇති කිරීමට පවා හේතුවක් විය නොහැකි ද?

3) ඒ අනුව වඩාත් ආචාර ධාර්මික වාර්තාකරණය ලෙසින් ඔබ තෝරා ගන්නේ කුමන පුවත් වාර්තාව(න්) ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# චීනා ද? චීන ජාතිකයා ද?

ETHICS EYE

**හොර පාස්පෝට් චීනා**
**එරට වරෙන්තුකරුවෙක්**
තමන්ම ගහගෙන නිලධාරීන් ගැහුව කියලා

අරුණ

**හොරෙන් ආ චීනා ඩුබායි**
**යවන්නැයි ඉල්ලූ පෙත්සම ඉවතට**

දිවයින

**පිටුවහල් කරන්න යන චීනාට**
**චීන උසාවියෙන් වරෙන්තුවක්**

ලංකාදීප

**බලපත්‍ර 2ක් සමග අත්අඩංගුවට පත්**
**චීන ජාතිකයා වරෙන්තුකරුවෙක්**
චීනයට පිටුවහල් නොකරන ලෙස ඉල්ලූ පෙත්සමත් නිෂ්ප්‍රභයි

අද

**විදෙස් ගමන් බලපත්**
**දෙකක් අරන් පැමිණි**
**චීන ජාතිකයා**
**කුඩු නඩුවක**
**වරෙන්තුකරුවෙක්**

දිනමිණ

**2023-05-30**